# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 19 දරන
# ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත

---

[සහතිකය සටහන් කළේ 1991 අප්‍රේල් මස 19 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1991 අප්‍රේල් මස 19 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 1.20 ශ.

තැපැල් ගාස්තුව : රු. 1.00 ශ.

# 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත

[සහතිකය සටහන් කළේ 1991 අප්‍රේල් මස 10 වන දින]
එල්. ඩී.—ඕ. 109/90

**අධ්‍යාපන සේවා කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1\. මේ පනත 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීම

2\. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිව යුතු සියලු අධිකාරී හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය, ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය. ජනාධිපතිවරයා විසින් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ප්‍රකාශයට පත් කළ යුතු බව.

(2) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට පහත දැක්වෙන කාරණා ඇතුළත් වේ:—

අධ්‍යාපනයේ පරමාර්ථ හා නිශ්චාවන් ; පෙර පාසැල්, ප්‍රාථමික, ද්විතියික, තෘතියික, උසස්, නොවිධිමත්, අවිධිමත්, වැඩිහිටි, විශේෂ, වෘත්තීය හා ආගමික යන අධ්‍යාපන ක්‍රමයේ ව්‍යූහය ; ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම හා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වූ ක්‍රම හා නිර්නායක ඇතුළුව අධ්‍යාපන ආයතනවල පිහිටීම සහ ඒවායේ ව්‍යාප්තිය ; ඉගැන්වීමේ මාධ්‍යය, විෂයමාලා විවිධාංගීකරණය, පෙළ පොත් සහ ඉගෙනුම් උපකරණ, ආගමික දැනුම, පිළිපැදීම හා පරිචය ලබන ස්ථානය, තක්සේරු කිරීම හා ඇගැයීම, විභාග ක්‍රමය, සහතික, අභිඥාන පත්‍ර සහ ශාස්ත්‍රීය ප්‍රදාන හා සුදුසුකම් පිළිගැනීම, ගුරුවරුන්, උපකාරක අධ්‍යාපන කාර්ය මණ්ඩලය, අධීක්ෂකයන් සහ පරිපාලකයන් ඇතුළුව අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථාපනය කිරීම, ඔවුන්ගේ විනය පාලනය සහ වෘත්තීය වර්ධනය ; ප්‍රජා සහභාගිත්වය උපයෝගි කර ගැනීම ද ඇතුළුව අධ්‍යාපනය සඳහා වූ සම්පත් ; සහ දිවා ආහාරය, සෞඛ්‍යය හා දන්ත සේවා, ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා ඇතුළුව ඉගෙනීම සඳහා වූ උපකාරක සේවා.

(3) 3 වන වගන්තියෙන් පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත කරනු ලබන නිර්දේශ හා දෙනු ලබන උපදෙස් සැලකිල්ලට ගැනීමෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සකස් කරනු ලැබිය යුතු ය.

3\. (1) මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවීම.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාම යෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් කොමිෂන් සභාව විසින් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

කොමිෂන් සභාවේ සංයුතිය.

4. (1) කොමිෂන් සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(ආ) 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා ;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක් ;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක් ;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක් ;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍ර වල හැකියාවක් දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ඨත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවට පූර්ණ කාලීනව සේවය කළ යුතු ය.

(2) යම් තැනැත්තකු, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වන්නේ නම්, ඔහු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එලෙස කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු විසින්, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මඟින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබීමෙන් බලාත්මක විය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින්, දක්වනු ලබන හේතු මත කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු පහක් විය යුතු ය :

එසේ වුව ද, කොමිෂන් සභාවේ එවැනි යම් සාමාජිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ පත් කරන ලද කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා පත් කරනු ලැබූ ඡේදයේ විධිවිධාන කෙරෙහි සැලකිලිමත්ව ඒ සාමාජිකයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා සුදුසු හා නිසි තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(7) (1) වන උපවගන්තියේ (අ) හෝ (ආ) ඡේදයෙහි සඳහන් සාමාජිකයකු, කොමිෂන් සභාවේ සාමාජිකයකු වූයේ යම් ධුරයක් දැරීම නිසාද, ඔහු ඒ ධුරය දරන තාක්කල් කොමිෂන් සභාවේ ස්වකීය ධුරය දැරිය යුතුය.

(8) පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික යක් කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවනු ලැබිය යුතු ය. කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවනු ලබන පාරිශ්‍රමිකය ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජික යාගේ ධුර කාලය තුළ එය අඩු කරනු නොලැබිය යුතු ය.

(9) (1) වන උපවගන්තියේ (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ පත් කරන ලද, කාලය ඉකුත්වීම නිසා ධුරය අත් හරින, කොමිෂන් සභාවේ සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(10) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් කොමිෂන් සභාවේ කිසිම ක්‍රියාවක් හෝ තීරණයක් හෝ කටයුත්තක් නිෂ්ඵල වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සභාපතිවරයා හා උප සභාපතිවරු.

5. (1) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරින් පිළිවෙලින් කොමිෂන් සභාවේ සභාපතිවරයකු, උප සභාපතිවරයකු (ප්‍රතිපත්ති) හා උප සභාපතිවරයකු (සැලසුම්) පත් කරනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයා හෝ උප සභාපතිවරයකු විසින් ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් අවස්ථාවෝචිත පරිදි, සභාපති හෝ උප සභාපති ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතුය.

(3) ජනාධිපතිවරයා විසින්, දක්වනු ලබන හේතු මත සභාපතිවරයා හෝ යම් උප සභාපතිවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධූර කාලය, කොමිෂන් සභාවේ ඔහුගේ සාමාජිකත්ව කාලය විය යුතු අතර, උප සභාපතිවරයකුගේ ධූර කාලය කොමිෂන් සභාවේ සාමාජිකත්ව කාලය විය යුතු ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උප සභාපතිවරයකුට රෝගාතුර වීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ඒ සභාපතිවරයා හෝ උප සභාපතිවරයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාවේ වෙනත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ රැස්වීම.

**6.** (1) සභාපතිවරයා කොමිෂන් සභාවේ සෑම රැස්වීමක ම මූලාසනය දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, ඒ රැස්වීමට පැමිණ සිටින යම් උප සභාපතිවරයකු ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා සහ උප සභාපතිවරුන් පැමිණ නොමැති විටක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ඔවුන් අතුරින් ඒ රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් අට දෙනකු විය යුතු ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණයක් සඳහා පැන නගින යම් ප්‍රශ්නයක් පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. දී ඇති ඡන්ද සංඛ්‍යාව සමාන වන විටක සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට තම ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්, එහි රැස්වීම් පිළිබඳ කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම, විධිමත් කරගනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව.

**7.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාව භාරයේ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ මුද්‍රාව, කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකු සහ ලේකම්වරයා ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය.

## II වන කොටස

### කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය.

8. (1) කොමිෂන් සභාවේ කර්තව්‍ය— කොමිෂන් සභාවේ කර්තව්‍ය

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම හෝ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස් වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීම හැකි කිරීමේ අදහස ඇතිව, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලැස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක ඒ ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම ;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දීම.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණාවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, කොමිෂන් සභාව විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය හැකි ය :—

(අ) සේවා නියුක්තිවලට, කර්මාන්තවලට හා සාමාජික අවශ්‍යතාවලට සරිලන පරිදි අධ්‍යාපනය සකස් කිරීමෙහිලා අවශ්‍ය වන, අධ්‍යාපනික ආයතනවල විෂයමාලාවල හා ඉගැන්වීම් ක්‍රමවල ඇති කළ යුතු වෙනස්කම් ;

(ආ) අධ්‍යාපනික ආයතනවල ශිෂ්‍යයන්ට ඔවුන්ගේ ස්වශක්තිය පූර්ණකාරයෙන් වැඩි දියුණු කර ගැනීමට හැකිවන පරිදි ලබාදිය යුතු මාර්ගෝපදේශකත්වයේ හා උපදේශ සේවාවල ප්‍රමාණවත් භාවය ;

(ඇ) අධ්‍යාපනික ආයතන හා ප්‍රජාව අතර සම්බන්ධතා ශක්තිමත් කිරීමෙහි ලා අවශ්‍ය වැඩ පිළිවෙළවල් ;

(ඈ) ප්‍රජාවේ සමස්ත මානුෂික සංවර්ධනය උදෙසා අධ්‍යාපනික ආයතන, සම්පත් මධ්‍යස්ථාන වශයෙන් වැඩි දියුණු කිරීම ;

(ඉ) ප්‍රාදේශීය වශයෙන් පාසල් අතර පවත්නා අතුල්‍යතා අඩු කිරීමෙහි ලා ගැනීමට අවශ්‍ය පියවර;

(ඊ) ගුරුවරුන්ගේ සහ අධ්‍යාපන සේවා කාර්ය මණ්ඩලයේ වෘත්තීය තත්ත්වය නගා සිටුවීමෙහි ලා ගැනීමට අවශ්‍ය පියවර ;

(උ) ප්‍රාථමික හා ද්විතියික පාසල් නියමිත කාලයට පෙර හැර යන ළමයින්ට, ඔවුන්ගේ ශක්‍යතාව පූර්ණාකාරයෙන් වැඩි දියුණු කර ගැනීමට හැකිවන පරිදි ඔවුන්ගේ ප්‍රයෝජනය සඳහා සැලැස්විය හැකි විකල්ප වැඩ සටහන් ;

(ඌ) සියලු ජන කොටස්වල සහ ආගම්වල ශිෂ්‍යයන්ගේ සංස්කෘතික හා ආගමික අපේක්ෂාවන් පෝෂණය කිරීමෙහි ලා අවශ්‍ය වන විෂයමාලාවල ඇති කළ යුතු වෙනස්කම් ;

(එ) එවැනි යම් නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය නීතිමය වෙනස්කම්.

අමාත්‍යවරයාගේ බලතලවලට බලපෑමක් නොවිය යුතු බව.

9. 2 වන වගන්තිය යටතේ ප්‍රකාශ කර ඇති ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට යටත්ව, යම් ලිඛිත නීතියක් යටතේ, අධ්‍යාපනයට අදාළ යම් විෂයයක් හෝ කර්තව්‍යයක් භාර අමාත්‍යවරයා විසින් හෝ රජයේ නිලධරයකු විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි බලතලවලට හෝ 8 වන වගන්තියෙහි සඳහන් යම් කාරණයකට මේ පනතේ ඇතුළත් කිසිවකින් බලපෑමක් හෝ හානියක් නොවිය යුතු ය. නැතහොත් එයින් බලපෑමක් හෝ හානියක් වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ බලතල.

10. (1) කොමිෂන් සභාවට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

(අ) 8 වන වගන්තිය යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා—

(i) අවශ්‍ය විය හැකි සමීක්ෂණ, විමර්ශන, අධ්‍යයන හා පර්යේෂණ කිසිවක් කර ගෙන යාම ;

(ii) විශේෂඥයන්ගේ, වෘත්තිකයන්ගේ හෝ මහජනතාවගේ අදහස් නිසැකව දැන ගැනීමේ අදහස ඇතිව, ප්‍රසිද්ධ හා පෞද්ගලික විමසීම් පැවැත්වීම ;

(iii) අධ්‍යාපන සැලසුම් පිළියෙල කරන ලෙස ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබූ විට, ඒ සැලසුම් පිළියෙල කිරීම ;

(iv) අධ්‍යාපනය හා සම්බන්ධ දීර්ඝකාලීන සැලසුම් සම්බන්ධීකරණය කිරීමෙහි ලා සහයවීම ;

(ආ) කොමිෂන් සභාවේ කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවෙන් බැහැරව පිහිටි සංවිධාන සමග සම්බන්ධතා ඇති කර ගැනීම හා පවත්වා ගෙන යාම ;

(ඇ) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරි කිරීමේ හෝ තැන්පත් ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම ;

(ඇ) මේ පනත යටතේ කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමෙහිලා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට ඇතුලුව ඒවා ඉටු කිරීම;

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයක පිහිටි පර්යේෂණ ආයතන හෝ පුද්ගලයන් මගින් අධ්‍යාපනික පර්යේෂණ පැවැත්වීමෙහි ලා කටයුතු පිළියෙල කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ සහ වෙනත් රටවල අධ්‍යාපනය හා ඊට අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වා ගෙන යාම;

(ඊ) චංචල, නිශ්චල යන දෙවර්ගයේම වූ ප්‍රදාන, පරිත්‍යාග පිළිගැනීම හා ඒවා භාර ගැනීම;

(උ) අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥතා සමූහ මණ්ඩලයක් නංවාලීමේ අදහස ඇතිව කොමිෂන් සභාවේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ නිපුණතා වැඩි දියුණු කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීම;

(ඌ) කොමිෂන් සභාවේ කර්තව්‍ය නිසි ලෙස ඉටු කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි යම් කමිටු, විශේෂඥ කණ්ඩායම් සහ උපදේශක මණ්ඩල පත් කිරීම;

(එ) කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි සහ ඉටු කිරීමෙහි ලා ආනුෂංගික හෝ එහිලා සම්බන්ධ සියලු ක්‍රියා හෝ වෙනත් දේ කිරීම.

(2) කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කළ හැකිනාක් දුරට (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් සමීක්ෂණ, විමර්ශන, අධ්‍යාපන හා පර්යේෂණ කරගෙන යාම සඳහා පවත්නා පොදු කාර්ය සංවිධානය සහ පහසුකා යොදගනු ලැබිය යුතුය. ජනාධිපතිවරයා විසින් කරනු ලබන විධානයක් මත හැර, ඒ කාර්යය සඳහා කොමිෂන් සභාවට අතිරේක පොදු කාර්ය සංවිධාන හෝ නව පහසුකා කිසිවක් සපයනු නොලැබිය යුතු ය.

## III වන කොටස

## කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

11. (1) කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා සභාපතිවරයා විය යුතු ය. ප්‍රධාන විධායක නිලධරයා

(2) මේ උපවගන්තියෙන් කොමිෂන් සභාව වෙත පවරා ඇති බලය හැර, මේ පනතින් එය වෙත පවරා ඇති බලතල අතුරින් යම් බලයක් කොමිෂන් සභාව විසින් යෝජනා සම්මතයක් මගින් සභාපතිවරයා වෙත පවරනු ලැබිය හැකි අතර, ඔහු වෙත පවරන ලද ඒ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධානයට සභාපතිවරයා යටත් විය යුතු ය.

(3) සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා වුවද, ඔහු කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ලේකම්වරයකු කොමිෂන් සභාවට සිටිය යුතුය. ලේකම්වරයා, කොමිෂන් සභාවේ එදිනෙදා පරිපාලන කටයුතු භාරව සිටිය යුතු ය. ලේකම්වරයා විසින්, කොමිෂන් සභාවේ රැස්වීම්වල වාර්තා සටහන් කරගනු ලැබිය යුතු අතර, ඒ රැස්වීම්වල දී කථා කිරීමට ඔහු හිමිකම ලැබිය යුතු නමුත්, එහි දී ඡන්දය දීමේ අයිතිවාසිකම ඔහුට නොතිබිය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ආදිය පත් කිරීම.

12. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින්—

(අ) කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව සලකන යම් නිලධරයන් හා සේවකයන් පත් කිරීම හා ඒ නිලධරයන් හා සේවකයන් විෂයයෙහි විනය පාලනය කිරීම් හෝ ඔවුන් සේවයෙන් පහ කිරීම;

(ආ) ඒ නිලධරයන්ට හා සේවකයන්ට පාරිශ්‍රමික ගෙවිය යුතු ප්‍රමාණ නියම කිරීම;

(ඇ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවය පිළිබඳ නියම හා කොන්දේසි නිශ්චය කිරීම;

(ඈ) ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා අර්ථසාධක අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හා විධිමත් කිරීම, සහ එවැනි යම් අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක මුදල් ගෙවීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රජයේ නිලධරයන් ආදීන් පත් කිරීම.

13. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට රජයේ සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, සහ එවැනි ම කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කිරීම, කරනු ලැබිය හැකි ය.

(2) රජයේ සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හෝ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රජයේ සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන ඒ නිලධරයාට හෝ ඔහු සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත්ව ඇති යම් තැනැත්තකු කොමිෂන් සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කොමිෂන් සභාව වෙත කරන ලද යම් සේවා කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) කොමිෂන් සභාවේ ඉල්ලීම පිට යම් උසස් අධ්‍යාපනික ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ උසස් අධ්‍යාපනික ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, සහ එවැනි ම කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් කොමිෂන් සභාව සහ ඒ ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟවන විශ්‍රාම වැටුප් සහ අර්ථ සාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ කොන්දේසි ද ඇතුළු යම් කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(6) යම් උසස් අධ්‍යාපනික ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත්වන විනය පාලනයට ඔහු ද යටත් විය යුතු ය.

(7) මේ වගන්තියේ "උසස් අධ්‍යාපනික ආයතනය" සහ "ප්‍රධාන විධායක නිලධරයා" යන යෙදුම්වල 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය.

## IV වන කොටස

## පොදු විධිවිධාන

14. කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු සහ කොමිෂන් සභාවේ සියලු නිලධරයන් හා සේවකයන් විසින් ම, ස්වකීය කාර්ය ආරම්භ කිරීමට කලින්, කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව පිළිපදින බවට පොරොන්දු වන ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර, ඒ ප්‍රකාශයෙන් ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන කාරණා කිසිවක්— රහස්‍යතාව ප්‍රකාශ කිරීම.

(අ) අධිකරණයක් විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබූ විට; හෝ

(ආ) මේ පනතේ විධිවිධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම පිණිස හැර, හෙළි නොකරන බවට පොරොන්දු විය යුතු ය.

වාර වාර්තා සහ තොරතුරු.

**15.** (1) මේ පනත යටතේ ස්වකීය බලතල හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට කොමිෂන් සභාවට හැකි කිරීමේ කාර්යය සඳහා, කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් කාලයක් ඇතුළත ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු යම් වාර වාර්තා හා තොරතුරු කොමිෂන් සභාව වෙත හෝ කොමිෂන් සභාව විසින් බලය දෙන ලද තැනැත්තා වෙත සපයන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය ; නැතහොත්, කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විභාගයක දී පෙනී සිටින ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ දැන්වීමක් මගින් යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් සපයන ලෙස හෝ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විභාගයක දී පෙනී සිටින ලෙස නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, යම් නීතියක විධිවිධාන යටතේ ඒ වාර වාර්තා හෝ තොරතුරු සැපයීමෙන් ඒ තැනැත්තා තහනම් කෙරෙන අවස්ථාවක දී හැර, ඒ දැන්වීමෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාලය ඇතුළත ඒ දැන්වීමෙහි නියමයන් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක නියම වලට අනුකූලව (1) වන උපවගන්තිය යටතේ සපයන ලද වාර වාර්තාවක ඇතුළත් කිසිම තොරතුරක්, ඒ වාර වාර්තාව හෝ තොරතුර සපයන තැනැත්තාගේ කැමැත්ත ඇතිව හැර නැතහොත් කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේ දී හැර කොමිෂන් සභාව විසින් පළ කිරීම හෝ වෙනත් යම් තැනැත්තකු වෙත ඇනුම්දීම, කරනු නොලැබිය යුතු ය.

(4) යම් සාක්ෂිකරුවකු විසින් යම් අධිකරණයක් ඉදිරියේ දී දෙනු ලබන සාක්ෂි සම්බන්ධයෙන් ඔහු හිමිකම් ලබන සියලු වර ප්‍රසාදවලට, මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විභාගයක දී සාක්ෂි දෙන සෑම තැනැත්තකු, ඒ සාක්ෂි සම්බන්ධයෙන් හිමිකම ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**16.** කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**17.** කොමිෂන් සභාව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර. ඒ අනුව, ඒ පනතේ විධිවිධාන තේරුම් ගනු ලැබිය යුතු ය.

18. (1) (අ) 15 වන වගන්තිය යටතේ තමා වෙත එවන ලද යම් දැන්වීමක නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන; වැරදි.

(ආ) 15 වන වගන්තිය යටතේ තමා වෙත එවන ලද දැන්වීමක නියමයන්ට අනුකූලව තමා විසින් සපයන ලද යම් වාර වාර්තාවක හෝ තොරතුරක දැන දැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන;

(ඇ) කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන යම් විභාගයක දී, දැනදැනම යම් අසත්‍ය හෝ වැරදි ප්‍රකාශයක් කරන;

(ඈ) කොමිෂන් සභාවේ සාමාජිකයකුව හෝ නිලධරයකුව හෝ සේවකයකුව, මේ පනත යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් තමා විසින් ලබාගන්නා ලද යම් තොරතුරක්, මේ පනතින් ඒ තොරතුර හෙළි කිරීමට බලය දෙන ලද කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළි කරන

සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ වරදක් කරන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු ම හෝ නිලධරයකු ම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුවද, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා සියලු උද්යෝගයෙන් ක්‍රියා කරන ලද බව ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ හවුල්කරු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

19. (අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවට විරුද්ධව; හෝ

මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

(ආ) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ කරන ලදැයි

කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

වාර්ෂික වාර්තාව.

20. කොමිෂන් සභාව විසින් එක් එක් මුදල් වර්ෂය අවසාන යේ දී, වෙනත් දේ අතර, ඒ වර්ෂය තුළ දී කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශ ඇතුළත් වාර්තාවක්, ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

රීති.

21. රීති සෑදීමට මේ පනතින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

නියෝග.

22. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්ය සඳහා අවශ්‍ය සියලු නියෝග අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපනය.

23. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"අධ්‍යාපනය" යන්නට, පෙර පාසැල් අධ්‍යාපනය, ප්‍රාථමික හා ද්විතීයික මට්ටම්වල විධිමත් පාසැල් අධ්‍යාපනය, තෘතීය අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, කෘෂිකාර්මික අධ්‍යාපනය හා පුහුණුව, නිපුණතා වර්ධනය පුහුණුව, නොවිධිමත්, අවිධිමත් හා වැඩිහිටි අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපනය, වෘත්තීය අධ්‍යාපනය, රැකියාමය හා කාර්මික අධ්‍යාපනය හා පුහුණුව සහ ආගමික අධ්‍යාපනය ඇතුළත් වේ;

"අධ්‍යාපනික ආයතනය" යන්නෙන්, අධ්‍යාපනය සලසන කවර හෝ ආයතනයක් අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, හෝ ඉටු කරනු ලබන බලතල, කර්තව්‍ය සහ කාර්යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ ඒ යටතේ ඇතිකොට පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ.

"පළාත් සභාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;

"ලේකම්වරයා" යන්නෙන්, කොමිෂන් සභාවේ ලේකම්වරයා අදහස් වේ; තවද

"සභාපතිවරයා" යන්නෙන්, කොමිෂන් සභාවේ සභාපතිවරයා අදහස් වේ.

24. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.